**ශීර්ෂය :- 285 - කෘෂිකර්ම දෙපාර්තමේන්තුව**

**----------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**-------------**

1.1 **තත්ත්වාගණනය කළ මතය**

**------------------------------**

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 මැයි 24 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**----------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

**------------------------------------------------------------------------------------------------**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරියාගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 **මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම**

-----------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5** **වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

-------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

**(අ) දේපල පිරියත හා උපකරණ**

පහත දැක්වෙන නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කර තිබුණු මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශය, ඒසීඒ - 6 ආකෘතිය අනුව සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට මූල්‍ය නොවන වත්කම්වල ආරම්භක ශේෂය රු. 26,383,858,018 ක් වුවද ඊට ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දේපළ පිරියත හා උපකරණ විෂයෙහි හා ඊට අදාළ සංචිත ශේෂය රු. 24,525,447,790 ක් වූයෙන් රු.1,858,410,228ක ගැලපීම්වලට අදාළ තොරතුරු මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | ලිපි ගොනුවෙහි සිදුව ඇති අතපසුවීමක් හේතුවෙන් 2020 දෙසැම්බර් 31 දිනට ගැලපීම් සිදු කිරීමට පෙර පැවති ශේෂ 2021 ජනවාරි 01 දින ආරම්භක ශේෂ ලෙස සඳහන් වී ඇති අතර නිවැරදි කරන ලද වටිනාකම් සහිත මූල්‍ය ප්‍රකාශන (ACA-6) ආකෘතිය මේ සමග අමුණා ඇති බව දන්වා ඇත. | ශේෂ නිවැරදිව ඉදිරියට ගෙන ඒමටත් වෙනස්කම් පවතී නම් ඊට අදාළ ගැලපීම් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමටත් කටයුතු කළ යුතුය. |
| (ii) | ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති මූල්‍ය නොවන වත්කම් දේපළ පිරියත හා උපකරණ ශේෂය මූල්‍ය ප්‍රකාශන අනුව රු. 24,525,447,790 ක් වුවද භාණ්ඩාගාර මුද්‍රිත ප්‍රකාශය SA82 ආකෘතිය අනුව සමාලෝචිත වර්ෂයේ ජනවාරි 1 දිනට ශේෂය රු. 24,528,396,296 ක් වූයෙන් රු. 2,948,506 ක වෙනසක් පැවතුණි. | එම වෙනස නිවැරදි කිරීම සඳහා 2021 වර්ෂය තුළදී මාරු පත්‍රයක් යොමු කර ඇති අතර මේ වන විට එම වෙනස නිවැරදි කර ඇති බව දන්වා ඇත. | ශේෂ නිවැරදිව ඉදිරියට ගෙන ඒමත් වෙනස්කම් පවතී නම් ඊට අදාළ ගැලපීම් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළයුතුය. |
| (iii) | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබුණු මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශය, ඒසීඒ - 6 ආකෘතිය අනුව සහ භාණ්ඩාගාර ප්‍රකාශය SA82 ආකෘතිය අනුව වෙනත් යන්ත්‍ර හා උපකරණ විෂයයන්ට අදාළ එක් එක් ශේෂ වල වෙනස්කම් පැවතුණි. | ලිපිගොනුවෙහි සිදුව ඇති අතපසුවීමක් හේතුවෙන් 2020 දෙසැම්බර් 31 දිනට ගැලපීම් සිදු කිරීමට පෙර පැවති ශේෂ 2021 ජනවාරි 01 දින ආරම්භක ශේෂ ලෙස සඳහන් වී ඇති අතර නිවැරදි කරන ලද වටිනාකම් සහිත මූල්‍ය ප්‍රකාශන (ACA-6) ආකෘතිය මේ සමග අමුණා ඇති බව දන්වා ඇත. | භාණ්ඩාගාර මුද්‍රිත සමග පරීක්ෂාකර නිවැරදි කළ යුතුය. |
| (iv) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ප්‍රවාහන උපකරණ ශේෂය රු.1,439,705,548 ක් වුවද, මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කර තිබුණු මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශය, ඒසීඒ - 6 ආකෘතිය අනුව එම ශේෂය රු.1,192,187,538 ක් වූයෙන් ප්‍රවාහන උපකරණ ශේෂය රු.247,518,010 ක් අඩුවෙන් | පවතින වෙනස ආරම්භක ශේෂ යටතේ පරිගණක වැඩසටහනට මෙම වර්ෂයේ ජූනි 30 දිනට ගිණුම්ගත කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත. වටිනාකම හඳුනා නොගත් වාහන 184 තක්සේරුකර CIGAS පරිගණක වැඩසටහනට ඇතුළත් කිරීමට කටයුතු කරන බව | වටිනාකම් තක්සේරුකර ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | දක්වා තිබුණි. එමෙන්ම දෙපාර්තමේන්තුවට අයත් වාහන 184 ක වටිනාකම ගණනය කර හෝ මූල්‍ය ප්‍රකශනවල ඇතුළත් කර හෝ නොතිබුණි. | දන්වා ඇත. | |
| (v) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගොඩනැගිලි හා නොනිමි වැඩ ශේෂය රු.6,491,554,294 ක් වුවද මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කර තිබුණු මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශය, ඒසීඒ - 6 ආකෘතිය අනුව එම ශේෂය රු.1,908,156,606 ක් වූයෙන් ගොඩනැගිලි හා නොනිමි වැඩ ශේෂය රු.4,583,397,688 ක් අඩුවෙන් දක්වා තිබුණි. එමෙන්ම දෙපාර්තමේන්තුවට අයත් ගොඩනැඟිලි 148 ක් තක්සේරු කිරීම සඳහා ඉදිරිපත් කර තිබුණද තක්සේරුකර නොතිබුණු අතර ගොඩනැඟිලි 1388 කට අදාළව වටිනාකම් හඳුනාගැනීම සඳහා තක්සේරු කර නොතිබුණි. | ඇතැම් උප ඒකක මඟින් තොරතුරු එවීමේ දී වටිනාකම් ඇතුළත් නොකර එම තොරතුරු එවීම නිසා CIGAS පරිගණක වැඩසටහනේ වටිනාකම් හි වැඩි අගයක් පෙන්වනු ලැබේ. තවද තක්සේරු කිරීමට ඇති අනෙකුත් වත්කම් තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | වත්කම් තක්සේරුකර වටිනාකම් ගිණුම් ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (vi) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වත්කම් කළමනාකරණ අංශය විසින් ඉඩම් ශේෂයට අදාළ වටිනාකම ඉදිරිපත් කර නොතිබුණු අතර මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කර තිබුණු මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශය, ඒසීඒ - 6 ආකෘතිය අනුව එම ශේෂය රු.17,813,491,318 ක් විය. තවද ඉඩම් ඒකක 517 කට අදාළව වටිනාකම් ගණනය කර නොතිබුණු අතර ඉඩම් ඒකක 103 කට අදාළව භූමි ප්‍රමාණයන් ද හඳුනාගෙන වටිනාකම ගණනය කර ගිණුම්ගත කර නොතිබුණි. | ඉඩම් පිළිබඳ තොරතුරු ලබා දීම සඳහා නව ආකෘතියක් හඳුන්වා දී ඇති බැවින් එම තොරතුරු උප ඒකක වෙතින් අප වෙත ලබා ගැනීම මේ වන විටත් සිදු වෙමින් පවතින අතර එම තොරතුරු සම්පූර්ණ කර අවසන් වූ වහාම ඔබ වෙත දැනුම් දීමට කටයුතු කරන බව දන්වා ඇත. | දෙපාර්තමේන්තුව සතු වත්කම් හඳුනාගැනීම හා එම වත්කම්වල වටිනාකම් තක්සේරු කර ගිණුම්ගත කළ යුතුය. |
| (vii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලීබඩු ඇතුළුව වෙනත් යන්ත්‍ර හා උපකරණ ශේෂය රු.2,410,236,758 ක් වුවද මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කර තිබුණු මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශය, ඒසීඒ - 6 ආකෘතිය අනුව එම ශේෂය රු.995,223,344 ක් වූයෙන් ලීබඩු ඇතුළුව වෙනත් යන්ත්‍ර හා උපකරණ ශේෂය රු.1,415,013,414 ක් අඩුවෙන් දක්වා තිබුණි. එමෙන්ම පරිත්‍යාග ලෙස ලැබී තිබුණු වත්කම් වල වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | පරිගණක වැඩසටහන ආරම්භයේ දී ආරම්භක ශේෂ ලෙස ඇතුළත් කර ඇත්තේ වටිනාකම රු.5000 ට වඩා වැඩි අගයක් සහිත වත්කම් වන අතර සියළුම උප ඒකක වෙත පැවති මුළු යන්ත්‍ර හා උපකරණ ඇතුළත් නොවී පැවතීමත් එබැවින් පරිගණක වැඩසටහන තුළ ඇතුළත් වත්කම් සහ වත්කම් ලේඛනයෙහි දැනට පවතින වත්කම් හඳුනාගැනීමේ ප්‍රායෝගික දුෂ්කරතාවයක් පවතී. නමුත් හැකි උපරිමයෙන් පරිගණක වැඩසටහන හා ස්ථාවර වත්කම් ලේඛණයේ පවතින විෂමතාවයන් අවම කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | වත්කම් වල වටිනාකම හඳුනාගෙන ගිණුම් ගත කළ යුතුය. |

(ආ) **මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

පහත දැක්වෙන නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්වලට අදාළව මුදල් ගලා යාම රු. 6,055,095,662 ක් වුවද එය මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් යටතේ රු.4,641,593,129 ක් ලෙසට දැක්විමෙන් මුදල් ගලායාම් රු. 1,413,502,533 ක් අඩුවෙන් දක්වා තිබුණි. | පෙර වර්ෂවල මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කිරීමේදී පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් යටතට 1001 සිට 1102 දක්වා වන වැය විෂයන්වල වියදම් ඇතුළත් කර තිබූ බැවින්, 2021 හි මුදල් ප්‍රවාහ ප්‍රකාශය ද ඊට අදාළව සකස් කර ඇත. ඔබ විසින් දක්වා ඇති තොරතුරු ඉදිරි මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීමට සටහන් කර ගන්නා ලදී. | මෙහෙයුම් ක්‍රියාකාරකම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ii) | භෞතික වත්කම් ඉදිකිරීම හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්පත් කර ගැනීම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රමාණය රු.111,606,276 ක් වුවද එය රු.1,525,108,809 ක් ලෙසට රු.1,413,502,533 ක් වැඩියෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දක්වා තිබුණි. | විගණනයෙන් පෙන්වා දී ඇති තොරතුරු ඉදිරි මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීමට සටහන් කර ගන්නා ලදි. | ආයෝජන ක්‍රියාකාරකම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |

**(ඇ)** **අත්තිකාරම් ගිණුම් ශේෂ**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කර තිබුණු අත්තිකාරම් ගිණුම් පිළිබඳ ප්‍රකාශය ACA5 ආකෘතිය අනුව ගොවිපළ නඩත්තු හා බීජ අලෙවි අත්තිකාරම් ගිණුමෙ 2021 වර්ෂයේ හර කිරීම් හා බැර කිරීම් පිළිවෙලින් රු. 801,737,314 ක් සහ රු. 935,890,785 ක් ලෙස දැක්විය යුතු වුවද එම ආකෘතියේ එම අගයන් රු.198,325,389 ක් සහ රු.184,302,639 ක් ලෙස දක්වා තිබුණි. | නිවැරදි කරගැනීමට සටහන් කර ගන්නා ලදි | භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව මූල්‍ය ප්‍රකාශන වලට අදාළ ආකෘති නිවැරදිව පිළියෙල කළ යුතුය. |

**(ඈ) වාණිජ අත්තිකාරම් ගිණුම්**

පහත දැක්වෙන නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | අත්තිකාරම් කාර්යයට දායකත්වය දක්වන නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාල හා සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාල 05 කට අදාළ රු.60,132,527 ක ගබඩා සෘජුව ගොවිපල කටයුතු සඳහා යොදා ගෙන තිබුණ ද එම ගොඩනැගිලිවල වටිනාකම සමාලෝචිත වර්ෂයේදී ක්ෂය කර නොතිබුණි. | අත්තිකාරම් ගිණුමට අදාළ කරගත යුතු සියළු වත්කම් හඳුනාගෙන ක්ෂය කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | වත්කම් නිවැරදිව හඳුනාගෙන තක්සේරු කර ක්ෂය කළ යුතුය. |
| (ii) | පැල්වෙහෙර නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (බීජ) කාර්යාලයේ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට තොග තක්සේරු වාර්තාව අනුව රු. 353,304 ක පාරිභෝගික වී තොගය අවසන් නිමි තොගයට ඇතුලත් නොකිරීම නිසා වෙළෙඳ ගිණුමේ ලාභය එම අගයෙන් අඩුවෙන් දැක්විණි. | 2022 වර්ෂයේ ගිණුම් පිළියෙල කිරීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | තොග නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (iii) | හොරණ පලතුරු බෝග පර්යේෂණ ආයතනයේ සමාලෝචිත වර්ෂයේ තොග තක්සේරු වාර්තාව අනුව රෝපණ ද්‍රව්‍ය වටිනාකම රු.148,318 ක් ලෙසට ගිණුම්ගත කළ යුතු වුවද රු.1,107,318 ක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන්, රෝපණ ද්‍රව්‍ය තොගයේ වටිනාකම හා දළ ලාභය රු.959,000 කින් වැඩියෙන් දැක්වේ. | 2022 වර්ෂයේ ගිණුම් පිළියෙල කිරීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | තොග නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (iv) | දේශීය අර්තාපල් බීජ ප්‍රවර්ධනය කිරීමේ වැඩ සටහන යටතේ සමාලෝචිත වර්ෂය තුළ මිලට ගෙන තිබුණු එකතුව රු. 1,539,738 ක වත්කම් විෂයයන් 09 ක් අදාළ ගොවිපළ/නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලවල ස්ථාවර වත්කම් ලෙස ගිණුම් ගත කර නොතිබුණු අතර ඒ හේතුවෙන් ඊට අදාළ වත්කම් ක්ෂය ද ගිණුම්ගත කර නොතිබුණි. | 2021 වර්ෂයේ මිළදී ගත් රු. 1,539,738 ක භාණ්ඩ 09 කට අදාළ වටිනාකම් ඒ ඒ ගොවිපළවල ස්ථාවර වත්කම් ලේඛන සඳහා ඇතුළත් කර ඇති බව දන්වා ඇත. | වත්කම් නිවැරදිව හඳුනාගෙන තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (v) | ගොවිපල සංවර්ධන ව්‍යාපෘතිය යටතේ සමාලෝචිත වර්ෂය තුළ මිලට ගෙන තිබුණු එකතුව රු. 8,502,400 ක වත්කම් විෂයයන් 06 ක් අදාල ගොවිපලවල ස්ථාවර වත්කම් ලෙස ගිණුම් ගත කර නොතිබුණු අතර ඒ හේතුවෙන් වර්ෂයට අදාල යන්ත්‍ර ක්ෂය රු. 212,560 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වේ. | මෙම වත්කම් මේවන විට ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කර ඇත. | වත්කම් නිවැරදිව හඳුනාගෙන තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (vi) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.2,630,538 ක උපචිත වියදම් ගිණුම්ගත කර නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ වියදම් හා ණයහිමියන් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දැක්වේ. | අදාළ බිල්පත්, වවුචර් පත්, වියදම් සඳහා අනුමැති ප්‍රමාදවීම තුළින් නියමිත වියදම සනාථ කරගැනීමට නොහැකිවීම නිසා මෙවැනි පරස්පරතාවයන් ඇතිවී ඇති අතර, ඉදිරියේදී මෙවැනි අඩුපාඩු සිදුනොවීමට අවශ්‍ය පියවර හා උපදෙස් ලබාදී ඇති බව දන්වා ඇත. | උපචිත වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (vii) | ඉකුත් වර්ෂයේ විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාවේ 1.6.1 (අ) ඡේදයේ දැක්වුණු කඳපොළ බීජ අර්තාපල් ගබඩාවේ පොහොර අමු ද්‍රව්‍ය තොගයේ වටිනාකම රු.1,760,000 ක් හා සීතාඑළිය බීජ අර්තාපල් ගබඩාවේ නිමි තොගය රු.7,606,473 ක් අඩුවෙන් ගිණුම්ගත කිරීම නිවැරදි කිරීමේදී වරදවා ආරම්භක අමුද්‍රව්‍ය තොගයේ අගයට රු.7,606,473 ක් ලෙසට රු.5,846,473 ක් වැඩියෙන් ද ආරම්භක නිමි තොගයේ අගයට රු.1,760,000 ක් ලෙසට රු.5,846,473 ක් අඩුවෙන් ද ගිණුම්ගත කර තිබුණි. | මෙහි බලපෑම මුදල් රෙගුලාසි 515 ප්‍රකාරව 2022 වර්ෂයේ ගිණුම් පිළියෙල කිරීමේදී නිවැරදි කිරීමට සටහන් තබා ගත් බව දන්වා ඇත. | තොග නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (viii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින පොළොන්නරුව බීජ අලෙවිසැලේ ණයගැති ශේෂය රු.5,311,803 ක් වැඩියෙන් ගණනය කර තිබුණු බැවින් මූල්‍ය ප්‍රකාශනවල ණයගැති ශේෂය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දැක්වේ. | අත්වැරදීමකින් අත්තිකාරම් ගිණුමේ ශේෂයට කොන්ත්‍රාත් බීජ නිෂ්පාදකයින්ගේ නිෂ්පාදන අළෙවි කල ශේෂයද එකතු වී ඇති බැවින්, ණයගැති ශේෂය රු. 5,311,803 ක් අඩුවිය යුතු බව දන්වා ඇත. | ණයගැතියන් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 වියදම් කළමනාකරණය**

පහත දැක්වෙන නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙපාර්තමේන්තුවේ පුනරාවර්තන සහ ප්‍රාග්ධන වියදම් සඳහා වැඩසටහන් 01 සහ 02 යටතේ රු.7,220,490,000 ක ප්‍රතිපාදන සලසාගෙන තිබුණද , ඉන් රු.984,145,341 ක් ඉතිරි වී තිබුණු අතර එය සමස්ත ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 13.63 ක් විය. එමෙන්ම ඉතිරිවීම් වලින් | කොරෝනා වසංගත තත්ත්වය නිසා රටේ පැවති අස්ථාවරභාවය හේතුවෙන් ව්‍යාපෘති නියමිත කාලය තුළ නිම කිරීමට නොහැකි විය. | සමාලෝචිත වර්ෂය තුළ වෙන්කරනු ලබන ප්‍රතිපාදන කාර්යක්ෂමව හා ඵලදායීව උපයෝජනය කළ |

| | | | |
|---|---|---|---|
| | සියයට 61 ක් ප්‍රාග්ධන වියදම් ඉතිරිවීම් වන අතර එය රු.597,248,492 ක් හෙවත් ශුද්ධ ප්‍රාග්ධන ප්‍රතිපාදනයෙන් සියයට 28 ක් විය. | | යුතු වීම. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ සුළු පරිමාණ කෘෂිකාර්මික පර්යේෂණ ව්‍යාපෘතිය සඳහා රු.1,000,000 ක් සහ ඉකුත් වර්ෂයේ රු.3,000,000 ක ප්‍රතිපාදනයක් වෙන්කර තිබුණද එම ප්‍රතිපාදන සම්පූර්ණයෙන්ම ඉතිරි කර තිබීම හේතුවෙන් ව්‍යාපෘතිය මගින් ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු ඉටු වී නොතිබුණි. | 2021 වර්ෂයේ අදාළ ව්‍යාපෘති වල සියළු වියදම් JICA ව්‍යාපෘති කාර්යාලයෙන් දරා ඇති බැවින් මෙම ප්‍රතිපාදන යටතේ වියදම් දැරීමට වවුචර්පත් ඉදිරිපත් වී නැත. | වෙන් කරන ලද ප්‍රතිපාදන අදාල කාර්යයන් වෙනුවෙන් කාර්යක්ෂමව හා ඵලදායීව උපයෝජනය කළ යුතුය. |
| (ඇ) | 2019 දෙසැම්බර් 03 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 271/2019 හි 3.5 ඡේදය අනුව වැඩ සටහන් අනුව වියදම් සාරාංශය ACA (II) ආකෘතියේ එක් එක් වැය විෂයන්ට අදාළ ශුද්ධ ප්‍රතිපාදනයෙන් ඉතිරිය සියයට 5 කට සිමා විය යුතු වුවද දෙපාර්තමේන්තුවෙහි වැය විෂයන් 81 ක ශුද්ධ ප්‍රතිපාදනය වූ රු.3,868,116,234 න් රු. 877,810,325 ක් හෙවත් සියයට 23 ක් ඉතිරි වී තිබුණි. එම ඉතිරිය එක් එක් වැය විෂයන්වල සියයට 7ත් සියයට 96 ත් අතර පරාසයක විය. | කොරෝනා වසංගත තත්ත්වය මත වරින්වර කාර්යාල වසාතැබීම හේතුවෙන් සීමිත නිලධාරීන් පිරිසක් රාජකාරී කිරීමත්, නිලධාරීන් නිවසේ සිට රාජකාරී ආවරණය කිරීමත්, දේශීය හා විදේශීය ගමන් සීමාවීම හා නඩත්තු කටයුතු වල වියදම් අවමවීමත් වැනි හේතූන් මත ප්‍රතිපාදන ඉතිරි විය. | මූල්‍ය ප්‍රතිපාදන ප්‍රශස්ථ අයුරින් උපයොජනය කළ යුතුය. |

**2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

-----------------------------------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නිරීක්ෂණය<br>නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | වටිනාකම<br>රු. | අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | 1980 අංක 33 දරන පළිබෝධනාශක පාලන පනතේ 21(4) (අ) වගන්තිය | | පළිබෝධනාශක රෙජිස්ටාර් කාර්යාලය විසින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 23 දින වන විට පළිබෝධනාශක අලෙවිසැල් 232 ක් සඳහා බලපත්‍ර නිකුත් කර නොතිබුණි. | 2021 වසරේ රජය විසින් පළිබෝධනාශක ආනයනය නවතන ලද බැවින් පළිබෝධනාශක තොග නොමැති අලෙවිකරුවන් ලියාපදිංචිය සඳහා ඉල්ලුම් කර නොමැති බව දන්වා ඇත. | නියමිත කාලයතුළ බලපත්‍ර නිකුත් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ xix පරිච්ඡේදයේ 6.1 වගන්තිය | | යම්කිසි තනතුරකට වෙන් කරන ලද නිවාසයක් හැර අනෙකුත් සියලුම නිවාසවල බදු කාලය වසර 05 ක් වුවද සිදු කරන ලද නියැදි පරීක්ෂාවේදී ආයතන 2ක නිලධාරීන් 17 දෙනෙකු වර්ෂ 5 ඉක්මවා වසර 2 සිට වසර 10 දක්වා කාලයක් රජයේ නිවාසවල අඛණ්ඩව පදිංචි වී තිබුණි. | ඇතැම් නිලධාරීන්ගේ සේවා අවශ්‍යතාව මත බදු කාලය දීර්ඝ කර ඇති බවත් අනෙකුත් නිලධාරීන් වෙත ඉවත්වන ලෙස දැන්වා ඇත. බදු කාලය ඉක්මවා පදිංචි කාලයට දණ්ඩන කුලී අයකිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රාජ්‍ය සේවා කොමිසම් සභාවේ කාර්යය පරිපාටික රීති 1 කාණ්ඩයේ XVIII වන පරිච්ඡේදයේ 193 වන ඡේදය | | ආයතන 9 කට අයත් නිලධාරීන් 237 දෙනෙකු වසර 5 කට වැඩි කාලයක් එකම ආයතනයක සේවය කර තිබුණි. | ස්ථානමාරු පටිපාටීන්ට යටත්ව ස්ථාන මාරු කිරීමටත් ඇතැම් නිලධාරීන් වසර 5 ට වැඩි සේවා කාලයක් සහිත නිලධාරීන්ගේ ලේඛණයට නම් ඇතුළත් කර ඇත. | කාර්යපරිපාටික රීති හා විධි විධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඈ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | | දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ අංශ 13 කට අයත් ධාවනය වෙමින් පවතින රථවාහන 215 ක ඉන්ධන දහන පරීක්ෂාව සමාලෝචිත වර්ෂයට අදාළව සිදු කර නොතිබුණි. | ඉදිරියේදී ඉන්ධන දහන පරීක්ෂාවන් සිදු කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |
| (ඉ) | 2015 අප්‍රේල් 24 දිනැති අංක 03/2015 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය | 2,440,247 | විශ්‍රාම ගනු ලබන දිනටම විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ ලබාදීම සඳහා කටයුතු කළ යුතු වුවද සමාලෝචිත වර්ෂය තුළ විශ්‍රාම ගිය නිලධාරීන් 33 දෙනෙකුට අදාළව පෞද්ගලික ලිපිගොනුවේ කටයුතු නිම නොවීම මත ණය ශේෂ විශ්‍රාම පාරිතෝෂිකයෙන් අයකර ගැනීමට නොහැකිව පැවතුණි. | නිලධාරීන් 33 දෙනාගේ ණය ශේෂයන් අයකර ගැනීම සඳහා ක්‍රියාමාර්ග ගෙන ඇති බව දන්වා ඇත. | චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |

**2.3 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම**

පහත දැක්වෙන නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගනුදෙනු බේරා අවසන් කිරීමේ අත්තිකාරම් ගිණුම් 5 කට අදාළව වසර 18 ත් වසර 29 ත් අතර කාලපරාසයක් ඉක්මවා තිබුණු අනුමත නොකළ සමුච්චිත කාරක පාඩුවල එකතුව රු.67,146,096 ක් විය. | මෙම කරුණ රාජ්‍ය ගිණුම් කාරක සභාවක සාකච්ඡාවට ගැනීමෙන් අනතුරුව ඇවර කළ අත්තිකාරම් ගිණුම් සම්පූර්ණ වශයෙන් අවසන් කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | මුදල් රෙගුලාසි 518 හි විධිවිධාන ප්‍රකාරව ඇවර කිරීමේ කටයුතු සිදු කළ යුතු වීම. |
| (ආ) | විෂය අංක 285-05 දරන සහතික කළ බීජ හා රෝපණ ද්‍රව්‍ය අත්තිකාරම් කාර්යය ඇවර කිරීමේ අත්තිකාරම් ගිණුමට අදාළ වර්ෂ 29 ක් ඉක්මවා තිබුණු පියවිය යුතු ශේෂය රු.76,157 ක් පියවා නොතිබුණි. | මෙම අත්තිකාරම් ගිණුම් සම්පූර්ණ වශයෙන් අවසන් කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | මුදල් රෙගුලාසි 518 හි විධිවිධාන ප්‍රකාරව ඇවර කිරීමේ කටයුතු සිදු කළ යුතු වීම. |

**2.4 තැන්පත් ශේෂයන්**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| තැන්පත් කළ දින සිට වසර 2 ක් ඉක්මවූ එකතුව රු.4,495,882 ක තැන්පතු ශේෂ 7 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 අනුව කටයුතු කර නොතිබුණි. | බාහිර විගණන ආයතනයක් වෙත ගෙවීමට ඇති සහ ඉදිකිරීම් ආයතනයකට ගෙවීමට ඇති මුදල් මෙලෙස රඳවාගෙන ඇති බව දන්වා ඇත. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 සැලැසුම් කිරීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුවට අයත් ගන්නෝරුව වැව ප්‍රතිසංස්කරණය කිරීම සඳහා වෙනත් මූලධන වැය විෂයය 285-2-2-7-2507 යටතේ සමාලෝචිත වර්ෂයේදී රු.1,000,000 ක මූල්‍ය ප්‍රතිපාදන සළසාගෙන තිබුණද අදාළ මුදල යොදවා ගන්නේ කෙසේද යන්න පිළිබඳව ක්‍රියාකාරකම් ඇතුළත් සැලැස්මක් පිළියෙළ කර හෝ වැව ප්‍රතිසංස්කරණය කර හෝ නොතිබුණි. | ගන්නෝරුව වැව ප්‍රතිසංස්කරණය කිරීම සඳහා වැය ශීර්ෂ 285-2-2-7-2507 යටතේ රු. 1,000,000 ක ප්‍රතිපාදන වෙන්වී තිබූ අතර, ඒ සඳහා ක්‍රියාත්මක සැළැස්මක් සකස් කර තිබුණි. | වෙන් කරන ලද ප්‍රතිපාදන ප්‍රශස්ත අයුරින් උපයෝජනය කළ යුතුය. |

## 3.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රහංගල බීජ නිෂ්පාදන ගොවිපළේ මූලික හා සම්මත බීජ නිෂ්පාදනය සම්බන්ධයෙන් පසුගිය කන්න 7 ක අපේක්ෂිත ඉලක්කය බෝංචි, තක්කාලි හා රාබුවලට අදාළව එකතුව කිලෝග්‍රෑම් 12390 ක් වූ අතර ඒ සඳහා රු. 11,518,086 ක පිරිවැයක් දරා තිබුණද සත්‍ය මූලික බීජ නිෂ්පාදනය කිලෝග්‍රෑම් 4654 ක් වන අතර එය අපේක්ෂිත ඉලක්කයෙන් සියයට 37 වැනි ඉතා අඩු මට්ටමක පැවතුනි. | පැවති වියළි කාලගුණික තත්ත්වය, හිටුමැරීමේ රෝගී තත්ත්වය, අධික කාලයක් ගබඩා තුල තිබීම, ගුණාත්මක බවින් අඩු බීජ සිටුවීම නිසා මෙම වගාවන් ඉතා දුර්වල වර්ධනයක් සහිත වගාවන් වූ බැවින්, එම වගා වලින් ලැබෙන අස්වැන්න ඉතා අඩුය. අපේක්ෂිත වර්ෂාපතනය නොලැබීම හේතුවෙන් ඇතැම් වගාවන් සිදුනොකර බීජ ප්‍රමාණය නැවත හරවා යැවූ අවස්ථාවන්ද පවතින බව දන්වා ඇත. | අපේක්ෂිත ඉලක්ක ළඟාකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.3 අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යටතේ පවතින ආයතන, ගොවිජන සේවා කාරක සභා සමඟ ජාලගත කිරීමේදී ඊට අදාළ පරිගණකගත කිරීමේ කටයුතු ඉටුකරවා ගැනීම පිණිස ද්වීතීය මට්ටමේ තොරතුරු තාක්ෂණික සහකාර නිලධාරීන් 50 දෙනෙකු බඳවා ගැනීම පිණිස අවශ්‍ය අනුමැතිය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් ලබාගෙන නිලධාරීන් 23 දෙනෙකු බඳවාගෙන තිබුණි. කාර්ය මණ්ඩලය බඳවාගැනීම, ගොඩනැගිලි ස්ථාපිත, කිරිම ආදී වශයෙන් ජාල ගත කිරිම ආරම්භ කිරීමට අවශ්‍ය මූලික කරුණු සපුරා තිබුණ ද ජාලගත කිරීමේ කටයුතු සැලසුම් කළ පරිදි ආරම්භ කර නොතිබුණි. | මෙම කාර්යයයේ වගකීම කෘෂිකර්ම අමාත්‍යාංශය මඟින් දරා ඇති අතර, ජාලගත කිරීමක් සිදුනොවූ බැවින්, බඳවාගත් තොරතුරු තාක්ෂණ සහයකවරුන් විසිතුන්දෙනා දෙපාර්තමේන්තුවේ විවිධ ආයතනවල අනුමත කාර්යය මණ්ඩල තනතුරු අනුව අනුයුක්ත කර ඇත. | අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීම සඳහා සේවකයින් ඵලදායීව යොදා ගැනීම කෙරෙහි අවධානය යොමු කළ යුතුය. |
| (ආ) | කෘෂිකාර්මික නිෂ්පාදන සැකසුම් තාක්ෂණය වැඩිදියුණු කිරිම හා ප්‍රචලිත කිරිම සඳහා වූ කොරියානු විදේශාධාර ව්‍යාපෘතිය සඳහා රු.9,535,700 ක පිරිවැයක් දරා තිබූ අතර එම ව්‍යාපෘතිය හරහා ගොවි කණ්ඩායම් වෙත ලබාදීම | අදාල ගොවි කණ්ඩායම් වෙත ද්‍රව්‍ය නිකුත් කිරීම සඳහා දිස්ත්‍රික් නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාල වෙත නිකුත් කර ඇති බවත් විද්‍යාගාරයේ | වෙන් කරන ලද ප්‍රතිපාදන ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීම සඳහා |

| | | |
|---|---|---|
| සඳහා වටිනාකම රු. 1,577,011 ක් වූ භාණ්ඩ 27 ක් මිලදීගෙන තිබුණි. එහෙත් 2022 පෙබරවාරි 18 දින සිදුකළ භෞතික පරික්ෂාවේ දී භාණ්ඩ 11 ක් පමණක් ගොවීන්වෙත ලබා දී තිබූ බව නිරීක්ෂණය වූ අතර සුදුසු ගොඩනැගිල්ලක් හා ඊට විදුලිය ලබාගෙන නොතිබීම හේතුවෙන් අදාල උපකරණ නිෂ්කාර්යව හා ඌණ උපයොජිතව පැවතුණි. එමෙන්ම මෙම ව්‍යාපෘතියෙන් අපේක්ෂිත අඩු ආදායම් මට්ටමක් ඇති මඤ්ඤොක්කා ගොවීන්ගේ සහ සැකසුම්කරුවන්ගේ ආදායම් මට්ටම ඉහළ නැංවීමේ අරමුණ ඉටුවී නොතිබූ අතර දරා තිබුණු එකතුව රු.1,483,846 ක වියදම් ඍජුවම ව්‍යාපෘතියට අදාළ වී නොතිබුණි. | අඩුපාඩු සකස් කිරීමට, මාර්ගගත ක්‍රමය යටතේ ව්‍යාපෘතියේ සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීමට සහ කාර්යාල කටයුතු නිසි පරිදි ඉටුකිරීමට අවශ්‍ය උපකරණ මෙම ව්‍යාපෘතිය යටතේ මිලදි ගත් බව දන්වා ඇත. | ඵලදායීව යෙදවීමට කටයුතු කළ යුතුය. |

## 3.4 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ----------------------- | ------------------------------ | ------------ |
| (අ) | කෘෂිකර්ම අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට ලද ප්‍රතිපාදන මෙහෙයවා 2020 වර්ෂයේදී ක්‍රියාත්මක කර අවසන් කිරීමට ඉලක්ක කළ ව්‍යවසායකත්ව පොකුරු ගම්මාන සංවර්ධන හා අගයදාම වැඩසටහන ව්‍යාපෘතිය යටතේ පොලීගෘහ ඒකක 40 ක් ඉදිකිරිම ඉලක්ක කර තිබුණද 2021 ඔක්තෝබර් 12 දින වන විට ගෘහ ඒකක 16 ක් ඉදිකර නොතිබුණි. 2022 ජනවාරි 01 දින වන විටත් සමස්ත ප්‍රතිපාදනයන් සියයට 28 ක් හෙවත් රු.2,635,924 ක මුදලක් වැය නොකර ඉතිරිවී තිබුණි. | අදහස් දක්වා නොතිබුණි | ව්‍යාපෘති නියමිත කාලය තුළ නිම කළ යුතු අතර ප්‍රතිපාදන ප්‍රශස්ත ලෙස උපයෝජනය කළ යුතුය. |
| (ආ) | ව්‍යවසායකත්ව පොකුරු ගම්මාන සංවර්ධන හා අගයදාම වැඩසටහන යටතේ පැළ සිටු වීම සඳහා රු.795,000 ක් දරා වගා මලු මිලදීගෙන තිබුණද ගොවීන් 20 දෙනෙකු ඒවා භාවිතාකර නොතිබුණි. මිරිස් බීජ ගබඩා කර තබා ගැනීම සඳහා ශීතකරණයක් මිලදි ගැනිමට රු.200,000 ක් වෙන් කර තිබුණද 2021 ඔක්තෝබර් 12 දින වන විටද එය මිලදි ගෙන නොතිබුණි. මිරිස් පැල සඳහා දියර පොහොර යෙදීමට රු. 174,468 ක් වූ ලීටර් 500 ජල ටැංකි 40 ක් මිලදීගෙන තිබුණද ඒවා උපයෝජනය කර නොතිබුණි. එමෙන්ම මෙම ව්‍යාපෘතිය සඳහා වෙන්කළ ප්‍රතිපාදන වලින් ව්‍යාපෘතියට අදාල නොවන වෙනත් කාර්යයන් සඳහා රු.987,705 ක් ගෙවීම් සිදුකර තිබුණි. | පොහොර ද්‍රාවණ ටැංකි ලබා දීමට තීරණය කළේ ස්වයංක්‍රීයව ජලය හා පොහොර ලබා දීමට වුවද පසුව ගොවින් විසින් Dialog ආයතනයේ එම ස්වයංක්‍රීය මෘදුකාංගය ලබා ගැනීම ප්‍රතික්ෂේප කරන ලදී. | ව්‍යාපෘති සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන ඵලදායීව උපයෝජනය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | මීපිලිමාන, උඩරදැල්ල, සීතාඑළිය සහ පිදුරුතලාගල බීජ අර්තාපල් නිෂ්පාදන ගොවිපළවල අභ්‍යන්තර මාර්ග පද්ධතිය සෘජු ශ්‍රමය යටතේ කොන්ක්‍රීට් යොදා ඉදිකිරීම සඳහා රු.3,959,200 ක අමුද්‍රව්‍ය මිලදී ගැනීමට ලංසු කැඳවා තිබුණි. එහෙත් එක් එක් ගොවිපළේ කුමන අභ්‍යන්තර මාර්ගය කොපමණ ප්‍රමාණයක් සිදු කරන්නේද යන්න පිළිබඳ දළ සැලැස්මක් හා ප්‍රමාණ පත්‍රයක් (BOQ) පිළියෙළ කර නොතිබූ අතර ද්‍රව්‍ය ලැයිස්තු පමණක් සකස් කර තිබුණි. 2021 නොවැම්බර් 24 දින වැලි කියුබ් 36 ක් සහ මැටල් කියුබ් 72 ක් මිලදී ගැනීම වෙනුවෙන් රු.1,587,000 ක මුදලක් සැපයුම්කරු වෙත ගෙවා තිබූ අතර සිමෙන්ති, කොටු දැල් හා දැව මිලදී නොගැනීම හේතුවෙන් 2021 දෙසැම්බර් 02 දින වන විටද එම කාර්යයන් ආරම්භ කර නොතිබුණි. | වඩාත් සෝදා පාළුවට ලක්වන කොටස් පමණක් කොන්ක්‍රීට් කිරීම වාසිදායක වේ. එබැවින් ඉදිකරන මාර්ගයේ දිග කලින් තීරණය කිරීම අපහසුය. එබැවින් විධිමත් පරිදි ද්‍රව්‍ය නිකුත් කර ගොවිපල කළමනාකරුගේ පූර්ණ අධීක්ෂණය යටතේ හැකි උපරිම කොටසක් ඉදිකිරීමට මෙලෙස ප්‍රමාණ පත්‍ර සකස් කරන ලදි. සිමෙන්ති හා අනෙකුත් ද්‍රව්‍ය සපයාගෙන මෙම වර්ෂය තුළ මාර්ග ඉදිකිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | ඉදිකිරීම් වලට අදාල සැලසුම් පිළියෙල කළ යුතු අතර ඉදිකිරීම් නියමිත කාලය තුල නිමකළ යුතුය. |
| (ඈ) | බීජ ගොවිපළ වේගවත් සංවර්ධන වැඩසටහන යටතේ අඹේපුස්ස බීජ නිෂ්පාදන ගොවිපළ සඳහා බීජ වියලීම් සහ අස්වනු නෙලන යන්ත්‍ර මිලදී ගැනීම, වැසි ආවරණ ගෘහ ඉදිකිරීම, විසිරි ජල සම්පාදන පද්ධතියක් ඉදි කිරීම යනාදී ප්‍රාග්ධන ක්‍රියාකාරකම් 8 ක් සඳහා රු. මිලියන 37.19 ක් වෙන්කර තිබුණද එම කාර්යයන් 2021 නොවැම්බර් 16 දින වන විටද නිම කර නොතිබුණි. | මේ පිළිබඳ තොරතුරු අදාල අධ්‍යක්ෂවරයාගෙන් පිළිතුරු ලබාගෙන ඉදිරිපත් කරන බව දන්වා ඇත. | සමාලෝචිත වර්ෂයතුළ නිම කිරීමට අපේක්ෂිත කාර්යයන් නිසිපරිදි නිම කළ යුතුය. |
| (ඉ) | කාර්යාලයේ ඉඩකඩ පහසුකම් ප්‍රමාණවත් නොවීම හේතුවෙන් සාකච්ඡා කාමරයක් සහ ලේඛනාගාරයක් ස්ථාපිත කිරීමේ අරමුණින් රු.4,967,502 ක් වැය කර පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් කාර්යාලය ආසන්නයේ දෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම අනුමත කර තිබූ අතර එහි පාදම යොදා කුලුනු ඉදිකර වහලය පමණක් ඉදි කර තිබුණි. සමාලෝචිත වර්ෂයේදී රු.496,003ක් වැය කර එම ගොඩනැගිල්ලේ බිම් මහලේ වාර්තා කාමරයක් ඉදි කර තිබුණ ද එම කාමරයේද 2021 දෙසැම්බර් 24 දින වන විට සියයට 30 ක් පමණ වැඩ කටයුතු නිම කර නොතිබුණි. මේ අනුව ගොඩනැගිල්ලේ අනිකුත් වැඩ කටයුතු නිම නොකිරීම හේතුවෙන් ගොඩනැගිල්ල ඉදි කළ 2019 වර්ෂයේ සිට එය නිෂ්කාර්යයව පැවතුණි. | මෙහි වැඩකටයුතු නිම කිරීම සඳහා 2021 වර්ෂයේ රු. මිලියන 6 ක ප්‍රතිපාදනයක් ඉල්ලුම් කළද රු.500,000 ක මුදලක් පමණක් ලැබුණි. 2022 වර්ෂය සඳහා රු. මිලියන 7 ක ප්‍රතිපාදනයක් ඉල්ලුම් කළද රු.1,000,000 ප්‍රතිපාදන මුදලක් පමණක් වෙන් විය. | ඉදිකරන ලද මෙම ගොඩනැගිල්ලේ අනෙකුත් වැඩකටයුතු කඩිනමින් නිම කර ගොඩනැගිල්ල ඵලදායීව ප්‍රයෝජනයට ගත යුතුය. |

## 3.5 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගන්නොරුව කෘෂි තාක්ෂණ උද්‍යාන ඒකකය විසින් 2018, 2019 සහ 2020 වර්ෂයන් තුළ ඉදිකිරීම් කාර්යයන් 5 ක් සඳහා රු.508,924 ක ද්‍රව්‍ය මිලදී ගෙන තිබුණද එම කාර්යයන් 2021 ඔක්තෝබර් 29 දින වන විටද නිම කර නොතිබුණි. | අදාළ කාර්යයන් කඩිනමින් නිම කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | ඉදිකිරීම් කටයුතු අදාළ කාලය තුල නිම කළ යුතුය. |
| (ආ) | අන්නාසි, කෙසෙල් වගාව සහ ඌන භාවිත පලතුරු වගාවන්ට ජලය සම්පාදනය කිරීමේ අරමුණින් බිංදු ජල සම්පාදන පද්ධතියක් අඹේපුස්ස බීජ නිෂ්පාදන ගොවිපළෙහි හෙක්ටයාර් 2 ක වපසරියක ඉදි කිරීම සඳහා 2018 වර්ෂයේ රු.5,166,127 ක වියදමින් උපකරණ මිලදීගෙන තිබුණද ඉන් රු.2,398,957 ක උපාංග එළවළු බීජ නිෂ්පාදන ක්ෂේත්‍රයට යොදා තිබුණි. එමෙන්ම රු. 2,767,169 ක උපකරණ භාවිතා නොකර 2021 නොවැම්බර් 16 දින වන විටද ඌණ උපයෝජිතව පැවතුණි. | එම බිංදු ජල සම්පාදන පද්ධතිය එළවළු බීජ නිෂ්පාදන ක්ෂේත්‍රයට මාරුකිරීම සඳහා කටයුතු කර ඇත. | මිලදීගත් සම්පත් ඵලදායීව හා කර්යක්ෂමව උපයෝජනය කළ යුතුය. |

## 3.6 ප්‍රසම්පාදනයන්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගන්නෝරුව කෘෂිතාක්ෂණ උද්‍යාන ඒකකය රු. 653,072 ක් වටිනා මුරකුටි දෙකක් ඉදි කිරීම සඳහා ද්‍රව්‍ය මිලදී ගෙන තිබුණු අතර මුරකුටි දෙකෙහි තීන්ත ආලේප කිරීම, සිවිලිම සවි කිරීම, වොට් 20 බල්බ සවි කිරීම සඳහා වටිනාකම රු.116,114 ක් වූ ද්‍රව්‍ය මිලදීගෙන ද්‍රව්‍ය සියල්ල ගබඩාවෙන් නිකුත් කර තිබුණද 2021 නොවැම්බර් 26 දින වන විටද එම කාර්යයන් ඉටු කර නොතිබුණි. එමෙන්ම රු.25,470 ක් වටිනා අඟල් ½ ප්ලයි වුඩ් බෝඩ් 12 ක් මිල දී ගෙන නිකුත් කර තිබුණද එයද භාවිත කර නොතිබුණි. | අතිරික්ත ප්ලයිවුඩ් 06 කෞතුකාගාරයේ ප්‍රදර්ශන භාණ්ඩ තැබීමට ආධාරක සැකසීමට යොදාගන්නා ලදී. තීන්ත ආලේප කිරීම හා ලයිට් සවිකිරීම කඩිනමින් සිදු කිරීමට කටයුතු කරන බව දන්වා අත. | මිලදීගත් ද්‍රව්‍ය උපයෝජනය කර අදාල කාර්යයන් නිමකළ යුතුය |

## 3.7 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| රජයේ ඉඩම් පිළිබඳ කාර්යය සංග්‍රහයේ 224 වන වගන්තිය ප්‍රකාරව ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවලට අයත් ඉඩම් මැනීම් සිදු කර විධිමත්ව පවරා ගැනීම කළ යුතු වුවද දෙපාර්තමේන්තුවට අයත් අංශ 10 කට අයත් හෙක්ටයාර 3901.82 ක මුළු භූමි ප්‍රමාණයෙන් හෙක්ටයාර් 2935.35 ක් පවරාගෙන නොතිබුණි. | ආයතන රැසක් සමඟ සම්බන්ධීකරණය වෙමින් පවරාගැනීමේ කටයුතු මේවන විට සිදුකෙරෙමින් පවතී. | දෙපාර්තමේන්තුව භුක්ති විඳින සියළුම ඉඩම් නිරවුල් කර අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.8 රජයේ නිලධාරීන් ඇප තැබීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මුදල් රෙගුලාසි 880 සහ 612 වැනි අධිකාරිය වන රජයේ නිලධාරීන්ගේ ඇප ආඥා පනත ප්‍රකාරව ආයතන 05 ක ඇප මුදල් තැබිය යුතු නිලධාරීන් 28 දෙනෙකු විසින් 2021 දෙසැම්බර් 31 දින වන විටත් ඇප මුදල් තැන්පත් කර නොතිබුණි. | ඇපතැබීම සිදුකර නොමැති සියළු තනතුරු සඳහා ඇප තැබීමේ ඉදිරි කටයුතු සිදුවෙමින් පවතී. | මුදල් රෙගුලාසි අනුව අදාළ නිලධාරීන් විසින් ඇප තැබිය යුතුය. |

## 3.9 පාඩු හා හානි

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | අභ්‍යන්තර විගණන අංශ විසින් සීතාඑළිය බීජ අර්තාපල් ගබඩාවේ සිදු කරන ලද සෝදිසි පරීක්ෂාවේදී අනාවරණය කර ගත් රු. 2,278,890 ක මුදල් වංචාවට අදාලව 2021 මාර්තු 24 දින වන විට රු. 1,759,167 ක මුදලක් පමණක් අයකරගෙන තිබුණි. ඉතිරි රු. 519,723 ක් අය කර ගෙන නොතිබුණි. එමෙන්ම මෙම මුදල් වංචාවට අදාළ මූලික විමර්ශනය 2021 දෙසැම්බර් 01 දින වන විටද අවසන් කර නොතිබුණි. | ඉදිරියේදී විධිමත් විනය පරීක්ෂණයක් සිදුකර අදාළ මුදල් අයකරගැනීමට කටයුතු කරනු ලැබේ. | අලාභ අයකර ගැනීමට කටයුතු කළ යුතු අතර අදාළ නිලධාරීන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගතයුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කර තිබුණු පාඩු හා අත්හැරීම් පිළිබද ප්‍රකාශය (සටහන i) අනුව තව දුරටත් අය කර ගැනීමට හෝ කපා හැරීමට හෝ අත් හැරීමට ඇති හානි හා පාඩු පැවතුණි. සිද්ධි 436 කට අදාළව රු. 101,404,491 ක එම පාඩු හා හානි සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව අදාල කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 104(4) කටයුතු අවසන් ඉදිරි ක්‍රියාමාර්ග සිදු කරමින් පවතින පරීක්ෂණ 239 ක් සහ පරීක්ෂණ මණ්ඩල පත්කර ඇති අවසන් වාර්තා නොලද පරීක්ෂණ 46 ක් සහ පරීක්ෂණ මණ්ඩල පත්කිරීමට ඇති ගොනු 29 ක් පවතී. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය. |

**3.10 විගණන විමසුම්වලට පිළිතුරු ලබා නොදීම**

-----------------------------------------------

දෙපාර්තමේන්තුව වෙත නිකුත් කරන ලද පහත විස්තර සඳහන් විගණන විමසුම් සඳහා 2022 මැයි 31 දින වන විටත් පිළිතුරු එවා නොතිබුණි.

| | විගණන විමසුම පිළිබඳ විස්තරය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සීතාඑළිය බීජ අර්තාපල් ගබඩාවේ මූල්‍ය හා කාර්යසාධන විගණනය - 2021<br>යොමුව:- KDA/B/AD/2/21/B/47 2022.03.09 | අදාළ ඒකක වෙතින් තොරතුරු ගෙන්වා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකර ඇති අතර, තොරතුරු ලද වහාම පිලිතුරු ඉදිරිපත් කරන බව දන්වා ඇත. | විගණන විමසුම්වලට අදාළ කාලය තුළ පිළිතුරු ලබා දිය යුතුය. |
| (ආ) | කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ රථ වාහන සම්බන්ධ පරීක්ෂණය<br>යොමුව:- KDA/B/AD/2/21/T/69 2022.04.08 | තොරතුරු ලද වහාම පිලිතුරු ඉදිරිපත් කරන බව දන්වා ඇත. | විගණන විමසුම්වලට අදාළ කාලය තුළ පිළිතුරු ලබා දිය යුතුය. |

**3.11 කළමනාකරණ දූර්වලතා**

---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රහංගල බීජ නිෂ්පාදන ගොවිපලේ ඉඩ පහසුකම් නොමැති වීමත්, ගබඩා තොග අතර ප්‍රමාණවත් පරතරයක් නොතිබීමත් හේතුවෙන් ගබඩා තුළට පහසුවෙන් ප්‍රවේශ වීම අපහසු වීම, ගබඩා පිරිසිදු කිරීමේ කටයුතු ක්‍රමානුකූලව සිදු නොකිරීම සහ ජීව්‍යතාවය අඩු වීමට පෙර තොග නිකුත් කිරීමට කටයුතු නොකිරීම හේතුවෙන් 2020 අගෝස්තු 18 හා 20 යන දිනයන්හි දී එකතුව රු.780,420 ක් වටිනා බඩ ඉරිඟු හා අනෙකුත් ධාන්‍ය බීජ කිලෝ ග්‍රෑම් 3,926 ක් කෘමි හානි හේතුවෙන් ප්‍රතික්ෂේප කර තිබුණි. | ඉඩපහසුකම් නොමැතිවීම මත ධාන්‍ය තොග ප්‍රමාණය තරමක් වැඩිවීමෙන් මෙම තත්ත්වය ඇතිවී ඇත. නව ගබඩාවක් මේ වනවිට ඉදිකිරීම් කටයුතු අවසන් වෙමින් පවතින බැවින් ඉදිකිරීම් කටයුතු වලින් අනතුරුව මෙම ගැටළුව විසඳා ගැනීමට හැකිවන බව දන්වා ඇත. | විධිමත් තොග කළමනාකරණ වැඩ පිළිවෙලක් පවත්වාගෙන යා යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සීතාඑළිය බීජ අර්තාපල් ගබඩාවේ පැවති වටිනාකම රු. 1,272,800 ක දෙමුහුම් බඩඉරිඟු බීජ කිලෝග්‍රෑම් 1591 ක් මාස 10 ක කාලයක් ගබඩාවල තැබීම හේතුවෙන් ප්‍රරෝහනය අවම වීම මත ප්‍රතික්ෂේප කර තිබුණි. | විදේශීය බීජ වර්ග සමඟ ඇතිවූ තරඟකාරීත්වය හේතුවෙන් මෙම නව බීජ වර්ගය ගොවීන් අතර ප්‍රචලිත කිරීමට අපහසු වීම මත අඩු අලෙවිය හේතුවෙන් ගබඩාවේ තබන ලදි. | නිෂ්පාදිත බීජ අවශ්‍ය අංශ වෙත අප්‍රමාදව නිකුත් කළ යුතුය. |
| (ඇ) | ගොවිපළ අත්තිකාරම් ගිණුමට අදාළ වසර 01 සිට වසර 08 දක්වා කාල පරාසයක් ගත වී තිබුණු එකතුව රු. 14,399,028 ක ණයගැති ශේෂ මුදල් රෙගුලාසි 175(2) ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට ද අය කර ගෙන නොතිබුණි. | ඉදිරියේදී අප්‍රමාදව මෙම ණය අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. | හිඟ ණය අයකර ගත යුතුය. |
| (ඈ) | කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කටයුතු සඳහා 2017 වර්ෂයේදී ලබා දී ඇති රු. 12,175,459 ක ප්‍රතිපාදනය ණයහිමි ශේෂයක් ලෙස ගොවිපළ අත්තිකාරම් ගිණුමේ ගිණුම්ගත කර පැවතියද එය සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් පියවා නොතිබුණි. | කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් අප වෙත ලබා දී ඇති ප්‍රතිපාදනයක් බවත්, ණය ශේෂයක් නොවන බවත් දන්වා ඇත. | පිළිතුර පිළිගත නොහැක. මෙම ශේෂය ගොවිපළ අත්තිකාරම් ගිණුමට අදාල බැවින් පියවීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | ගොවිපළ අත්තිකාරම් ගිණුමට අදාළ ආයතන 27 ක වත්කම්වලින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට ආයතන 13 ක වත්කම් ප්‍රත්‍යාගණනය කර නොතිබුණි. මෙම හේතුව නිසා ආයතනය සතුව පවතින වත්කම්වල නිවැරදි වටිනාකම හඳුනා ගැනීමට නොහැකි වූ අතර, වර්ෂයට අදාළ ක්ෂය වියදම නිරවද්‍ය නොවන බවත් නිරීක්ෂණය විය. | ප්‍රවර්තන වසරේදී මෙම කටයුතු අවසන් කිරීමට සැළසුම් කර ඇති බව දන්වා ඇත. | අදාළ ප්‍රත්‍යාගණනයන් සිදු කර වත්කම්වල නිවැරදි අගයන් ලේඛණගත කළ යුතුය. |
| (ඊ) | ආයතන සංග්‍රහයේ XXIV වන පරිච්ඡේදයේ 4 හා 6 ඡේද අනුව මියගිය, විශ්‍රාම ගිය, සේවා කාලය ප්‍රමාණවත් නොවීම නිසා විශ්‍රාම වැටුපක් රහිතව විශ්‍රාම ගිය, වැඩ තහනම් කර ඇති, විදේශගතව සේවය හැර ගිය හා මධ්‍යගත කිරීම යටතේ විවිධ අංශ මඟින් මාරු කර තිබූ නිලධාරීන් 127 කට අදාළව එකතුව රු.6,772,208 ක ණය ශේෂ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් අය කර ගෙන නොතිබුණි. | අදාල හිඟ ණය ශේෂයන් අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන ඇති බව දන්වා ඇත. | ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව හිඟ ණය මුදල් අයකර ගත යුතුය. |
| (උ) | 2004 ඔක්තෝබර් 11 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ අංක 118 හි 5.2 ඡේදය අනුව දේපළ ණයක් ලබාගෙන ඇති ණයකරු, ණය වාරික නොපියවන්නේ නම් නීතිපතිගේ උපදෙස් මත අදාළ දේපළ වෙන්දේසි කර එම හිඟ ණය ශේෂය පියවා දැමීමට කටයුතු කළ යුතු වුවද, දෙපාර්තමේන්තුවේ සේවය කළ නිලධාරීන් 7 කට අදාළ එකතුව රු. 681,033 ක දේපළ ණය සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි. | ඇතැම් හිඟ ණය අයකර ගැනීම සඳහා දේපල වෙන්දේසි කිරීම, නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සහ අදාල නිලධාරීන් ලිඛිතව දැනුවත් කිරීම් සිදු කර ඇති බව දන්වා ඇත. | චක්‍රලේඛ අනුව හිඟ ණය අයකර ගැනීම සඳහා කටයුතු කළ යුතුය. |

**4. තිරසර සංවර්ධන අරමුණු ළගා කර ගැනීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| තිරසාර සංවර්ධන අරමුණුවලට අදාළව 2030 වර්ෂය වන විට කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් ළඟාකර ගැනීමට බලාපොරොත්තු වන හා ළඟාවිය යුතු සංධිස්ථානයන් සහ ළඟාකර ගැනීමට බලාපොරොත්තු වන අරමුණුවල ප්‍රගතියේ මට්ටම පිළිබඳ සැලසුම් සකස් කර නොතිබුණි. එමෙන්ම මෙම අරමුණුවලට අදාළ දර්ශකවල වර්තමාන ප්‍රගතිය මැන බැලීම සඳහා පදනම් දත්තද (Base line data) රැස් කර නොතිබුණි. | 2022 වර්ෂයේ සිට 2025 වර්ෂය දක්වා වූ තිරසාර සංවර්ධන අරමුණු ළඟා කරගැනීම සඳහා වූ සැළසුම් මේ වන විට සකස් කර ඇත. ඒ අනුව, 2019 පාදක වර්ෂය ලෙස ගනිමින් දෙපාර්තමේන්තුවේ නිෂ්පාදන සැළැස්මට පදනම්ව 2025 වර්ෂය දක්වා සාක්ෂාත් කල යුතු දෙපාර්තමේන්තු ඉලක්ක මේ වන විට හඳුනාගෙන සකස් කර ඇත. | එක් එක් අරමුණු හා ඉලක්ක වල ප්‍රගතිය මැනීම සඳහා මිණුම් ක්‍රමයක් සහ පදනම් දත්ත රැස් කිරීමට කටයුතු කළ යුතුය. |

**5. මානව සම්පත් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් කාර්යාලයේ පළිබෝධනාශක පාලනය කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුර සහ සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (කෘෂි පර්යේෂණ) තනතුරු පුරප්පාඩු 07 ක් පැවතුණි. | විවෘත හා සීමිත පදනම මත බඳවාගැනීම සඳහා වෙන වෙනම අයදුම්පත් කැඳවා ඇත. එකී තරඟ විභාගය හා සම්මුඛ පරීක්ෂණය පැවැත්වීමෙන් පසුව නිලධාරීන් බඳවා ගැනීමට හා ඉන් අනතුරුව පුරප්පාඩු පිරවීමට හැකි බව | කඩිනමින් පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු බව |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ කාර්යමණ්ඩල පුරප්පාඩු පහත දැක්වේ. | ඇතැම් තනතුරු සඳහා බඳවා ගැනීමට කටයුතු කර ඇති බවත් ඇතැම් තනතුරු සඳහා බඳවා ගැනීම් ජාතික අයවැය චක්‍රලේඛ 3/2022 අනුව තාවකාලිකව අත්හිටුවා ඇති බවත් දන්වා ඇත. | කඩිනමින් පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය. |

| | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | ඌණතාවය |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 1050 | 414 | 636 |
| තෘතීය මට්ටම | 208 | 72 | 136 |
| ද්විතීය මට්ටම | 3638 | 2945 | 693 |
| ප්‍රාථමික මට්ටම | 6150 | 4778 | 1372 |
| එකතුව | 11046 | 8209 | 2837 |